වී පත්‍රයේ නාරටි ප්‍රමාණය, නාරටි පිහිටීම, පත්‍රයේ දිග,පළල පත්‍රයේ හරස්කඩ ආදී ලක්ෂණ අතින් ඉහළින්ම ඇති වී වර්ග 3ක් මෙම පර්යේෂණයෙන් සොයා ගන්නා ලදි. ඉහත ලක්ෂණ වැඩි වීම යනු ශාකයේ ප්‍රභාසංස්ලේෂණය වැඩි වීමයි.ඒවා නම් **මහසුදුවී**, **මහකුරු වී**, සහ **තන්තිරිබලත්** යන වී ප්‍රභේදයන්ය.
ඉහත සොයා ගත් පරිදි තවත් එවැනි හොඳ ලක්ෂණ සහිත වර්ග, 2000ක් පමණ වන ලංකාවේ දේශීය වී වර්ග අතර පිහිටා තිබේ.

ඒ වගේම අලුත් වී වර්ග වැඩි දියුනු කරන පර්යේෂණ ආයතන දේශීය වී වර්ග වලට මීට වඩා යොමු වුවහොත් ඉහත පරිදි හොඳ ලක්ෂණ සහිත වර්ග හඳුනාගෙන ඒවා භාවිතයෙන් දැනට තියන හොඳම ප්‍රභේදයටත් වඩා හොඳ වී වර්ගයක් ගොවියන්ට හඳුන්වා දීමට හැකියාව ලැබේ.

***වර්තමානයේ මෙය ජනතාවට ඉතාම අත්‍යාවශ්‍ය දෙයක් වන නිසා ඒ සඳහා වැඩි අවධානයක් යොමු කරමු.***






This is a non-technical summary of the project report titled “Comparative analysis of leaf shape and leaf anatomy of traditional rice varieties” supervised by Dr. H.M.V.G. Herath*, Department of Agricultural Biology.
* venuraherath@gmail.com

# ගුණාත්මකභාවය වැඩිදියුණු වන ආකාරයට ගර්කින් පරිරක්ෂණය කරමු

මනෝරි හේරත්

එළවළු කුලයට අයත් වන, අපනයනමය වටිනාකමක් සහිත භෝගයක් ලෙස, ගර්කින් ගොවියන් අතර ප්‍රචලිත වෙමින් පවතින අතර, වර්තමානය වන විට ශ්‍රී ලාංකික ගොවියන් 10,000 ක් පමණ ගර්කින් වගාව සඳහා යොමු වී ඇත.”

ගර්කින් සලාද වශයෙන් මෙන්ම පිසින ලද ආහාරයක් ලෙසද පර්භෝජනයට ගත හැකි අතර, පරිරක්ෂණය කරන ලද ගර්කින් (අච්චාරු) සඳහා ඉහළ විදේශීය ඉල්ලුමක් පවතී. එබැවින් ගර්කින් හා ඒ ආශ්‍රිත නිශ්පාදන ඉහළ ආර්ථික ලාභයක් ලබා ගත හැකි වාණිජමය කර්මාන්තයක් ලෙස හැඳින්විය හැක.

මෙහිදී කර්මාන්තකරුවන් ලුණු ද්‍රාවණයක් යොදා ගනිමින් ගර්කින් පැසවීමේ ක්‍රියාවලිය සිදුකරනු ලබන අතර, මෙම ලවණකරණ ක්‍රියාවලියේදී සිදු කරනු ලබන විවිධ ක්‍රියාකාරකම් නිසා ගර්කින් නිශ්පාදනවල ගුණාත්මක භාවය වෙනස් වේ. එමෙන්ම පෙර හා පසු අස්වනු ක්‍රියාකාරකම් මත ද මෙහි ගුණාත්මක භාවය රඳා පවතින අතර, ලවණ ද්‍රාවණයේ සංයුතියද මීට හේතු විය හැක.

එය තහවුරු කර ගැනීම උදෙසා සිදුකරනු ලද මෙම අධ්‍යනය සඳහා, මූලික වශයෙන් ගර්කින් ප්‍රභේද 3ක් යොදාගෙන ඇත. (Ajex, Chandani, Eclipse) මේ අතරින් Ajex ප්‍රභේද ඉහළ ගුණාත්මක භාවයකින් යුක්ත බව පරීක්ෂණාත්මකව තහවුරු වී ඇති නමුදු, වර්තමානයේ දේශීය මෙන්ම විදේශීය වෙළඳපොළ තුළ Chandani ප්‍රභේදයට ඉහළ ඉල්ලුමක් පවතින නිසා මෙම අධ්‍යනය Chandani ප්‍රභේදය මූලික කොට ගෙන සිදු කර ඇත. මේ යටතේ දින 30ක පැසවීමේ ක්‍රියාවලියට Chandani ප්‍රභේදය බඳුන් කරන ලද අතර, අවසානයේදී පහත නිගමනයන්ට එළඹීමට හැකියාව ලැබී ඇත.



ලවණ ද්‍රාවණයට එකතු කරනු ලබන කැල්සියම් නම් රසායනික සංයෝගයේ ප්‍රමාණය මත අවසන් නිශ්පාදනයේ ගුණාත්මක භාවය රදාපවතී.

ලවණ ද්‍රාවණයේ pH අගය, අවසන් නිෂ්පාදිතයේ ගුණාත්මක භාවයට සෘජු ලෙසම බලපානු ලබයි.

බොහෝ නිශ්පාදකයන් B – 80 නමින් හඳුන්වනු ලබන ක්ලේ වර්ගයක් පැසවීමේ ක්‍රියාවලියේදී යොදා ගන්නා අතර, අවසන් නිශ්පාදිතයේ ගුණාත්මක භාවය ඉහළ නංවා ගැනීම මෙමගින් අරමුණු වේ. නමුත් එකතු කරනු ලබන ක්ලේ ප්‍රමාණය මත ගුණාත්මක භාවයෙ වෙනස් වීම් සිදුවන බව තහවුරු වී ඇත.

ගබඩා කරනු ලබන කාලසීමාව අනුව මෙන්ම පිරිසැකසුම් ක්‍රියාවලියේදී අනුගමනය කරනු ලබන ක්‍රියාවලීන් මතද, ගුණාත්මක භාවය රඳා පවතී.

නිසි ගුණාත්මක භාවයෙන් යුක්තව නිශ්පාදන කටයුතු සිදු කරන්නේ නම් ගර්කින් යනු ඉහළ විදේශ විනිමයක් පහසුවෙන් උපයා ගැනීමේ හැකියාවක් සහිත අපනයන භෝගයකි.”

This is a non-technical summary of the project report titled “Factors affecting the texture of fermented Gherkin” supervised by Prof. D.C.K. Illeperuma*, Department of Food Science and Technology.

* dchamaraki@hotmail.com



# කිරි බිඳුවේ රස ගුණ සුරකිමු

මලින්ද හුළුගල්ල

කෘෂි ආර්ථිකයකට හිමිකම් කියූ ශ්‍රී ලංකාවේ අතීතයේ සිටම ගව පාලනය තම ජීවනෝපාය කරගෙන ජීවත් වූ ජන කොටසක් ජීවත් විණි. අද එම සමාජය නවීකරණයට ලක්වී කිරි ගව පාලනය රටේ ආර්ථිකය ස්වයංපෝෂිත කිරීමට අත්වැල් බැඳගෙන සිටී. කිරි යනු ශරීරයකට අවශ්‍ය සියලු පෝෂ්‍ය පදාර්ථ එකට කැටිකර ගත් ආසන්න වශයෙන්ම පරිපූර්ණ වූ ආහාරයකි. වර්ධනයට සහ පැවැත්මට අවශ්‍ය සියළු පෝෂ්‍ය පදාර්ථ සියල්ල කිරිවල අඩංගු බැවින් කිරි ඉතා ඉක්මනින් නරක්වීමට ලක් විය හැකි ආහාරයකි.

නැවුම් කිරි කල් තබා ගැනීම සඳහා ලොව පුරා දශක ගණනාවක සිට පැස්චරීකරණය කිරීම සිදු කරයි. පැස්චරීකරණයේ දී භාවිත වන අඩු උෂ්ණත්වය නිසා නරක්වීම වළක්වා ගැනීමට පැස්චරීකෘත කිරි ශීතකරණයක ගබඩා කළ යුතු වේ. පැස්චරීකරණය සහ ශීත කිරීම යන කරුණු යුගලම කිරිවල අඩංගු ස්වාභාවික බැක්ටීරියා ගහණයේ වර්ධනය අඩාල කරනු ලැබේ. එහෙත් පැස්චරීකරණයේ දී විනාශ නොවන බීජාණු නිපදවන ශීතකාමී බැක්ටීරියා ශීතකරණය තුළ ගබඩා කරන පැස්චරීකෘත කිරිවල වර්ධනය වීමේ හැකියාවක් පවතී. අප රටේ පැස්චරීකරණය කරන ලද කිරිවල ආයු කාලය වෙනත් රටවල එවන් නිෂ්පාදන වලට වඩා අඩුය.

අපිරිසිදු තත්ව යටතේ සිදුවන කිරි නිෂ්පාදනය කිරි වලට ශීතකාමී බැක්ටීරියා ඇතුල්වීමට හේතු වේ. කිරි නිෂ්පාදනයේ සෑම අවස්ථාවකදීම එම බැක්ටීරියා වර්ග කිරි වලට ඇතුල්වීම වැළැක්විය යුතුයි. මේ සඳහා කිරි ලබාගන්නා සතුන්ගේ සෞඛ්‍යය, කිරි එක් රැස්කර ගන්නා භාජනවල පිරිසුදුකම හා ප්‍රවාහනය, සතුන් වාසය කරන ස්ථානවල පිරිසිදුකම ගැන සැළකිලිමත් විය යුතුය. ලොව පුරා බුරුලු ප්‍රදාහය ඇති කරන ප්‍රචලිත බැක්ටීරියා වර්ග කිහිපයක් ශීතකාමී ඝනයට අයත් වේ. එවන් රෝගී සතුන්ගෙන් දොවාගන්නා කිරි මගින් නිෂ්පාදිත පැස්චරීකෘත කිරි වඩා ඉක්මනින් නරක් විය හැක.

ඉහත සඳහන් කළ බැක්ටීරියා වර්ග වල ඇති අයහපත් ප්‍රතිඵල අතර ප්‍රධාන වනුයේ ඔවුන් සතු ජීර්ණක එන්සයිම කිරිවල මේද කොටස් බිඳ දැමීමයි. එමගින් කිරිවල වයනය සහ රසය අයහපත් ලෙස වෙනස් වේ. කිරි වලට එකතු වන නිදහස් මේද අම්ල එයට මූලික ලෙස දායක වේ. එබැවින් සකස් කරන ලද නිෂ්පාදන භාවිත නොකරම කෙටි කළකින් ඉවත් කිරීමට සිදුවේ.

බුරුලු ප්‍රදාහය සහිත සතුන්ගේ කිරි වෙනම දොවා ගැනීමත්, කිරි දෙවීම සඳහා ගන්නා භාජන දිනපතා පිරිසිදු කිරීමත්, කිරි එකතු කරන ස්ථාන පිරිසිදුව පවත්වා ගැනීමත් තුළින් වඩා හොඳ නැවුම් කිරි නිෂ්පාදනයක් ළඟා කරගත හැකිවනවා මෙන්ම එම කිරි වෙනත් නිෂ්පාදනවලට යොදා ගැනීමටත් අවකාශය සලසනු ඇත.



This is a non-technical summary of the project report titled "Investigation of microbial quality, somatic cell count and lipolytic activity of raw milk collected from Galaha and Thalathuoya veterinary ranges" supervised by Dr. J. Vidanarachchi*, Department of Animal Science.

* janakvid@pdn.ac.lk



# මිනිසාට ඇති තර්ජනය ගවයාටද බලපායි

අරවින්ද මදුෂාන්

## වකුගඩු රෝගය බහුල ප්‍රදේශවල ගවයන්ගේ රුධිරයේ අන්තර්ගත බැර ලෝහ පිළිබඳ අධ්‍යයනය.

දැනට වකුගඩු රෝගීන් බහුලව ව්‍යාප්තව ඇති ප්‍රදේශයන්හි ගවයන්ගේ රුධිරයේ බැර ලෝහ වැඩිබව පේරාදෙණිය විශ්ව විද්‍යාලය සිදුකළ පරික්ෂණ මගින් සනාථ කර ඇති අතර ජලයේ බැර ලෝහ අඩංගුවීම මෙම තත්වයට ප්‍රමුඛ ලෙෂ බලපාන සාධකයක්බව පසුගිය සමයේ කළ ඇතම් පරික්ෂණ වාර්තා පෙන්වාදෙයි. කෘෂිකාර්මික කටයුතුවලදී භාවිත කරන කෘෂි-රසායනිකද්‍රව්‍ය මෙයට ආසන්න හේතුවක් ලෙසද වර්තා වේ.

කෘෂිකාර්මික සාමාජ පසුබිමක් ඇති මෙවන් ප්‍රදේශවල පස, තෘණභූමි, ජලාශ සහ එහි සිටින මත්ස්‍යය ගහනය පවා මෙම ගැටළුකාරී පරිසර දූෂණයට ගොදුරක් බවට පත්ව ඇත. එමනිසා ආහාර දාමයේ මුල්පුරුක් මත නිදහසේ උලාකමින් සිටින ගවයන් පිළිබඳ අධ්‍යයනය කිරීම කාලෝචිත බැවින් එම සත්වයන්ගේ රුධිරයේ අඩංගු බැර ලෝහ ප්‍රමාණය, එම ප්‍රදේශයන්හි පරිසරය තවදුරටත් කොපමණ දුරට දූෂණයවී ඇත්දැයි සාක්ෂියක්ද ගෙනහැරපායි.

කැඩ්මියම්, ක්‍රෝමියම්, වැනේඩියම් සහ ලෙඩ් වැනි බැර ලෝහ සහ බෝහමයක් අනෙකුත් ලෝහ වකුගඩු රෝගීන් බහුල ප්‍රදේශයක්වන පදවිය ප්‍රදේශයේ නිදහසේ උලාකන ගවයන්ගේ රුධිරයේ ඉහළ මට්ටමකද, වකුගඩු රෝගීන් වාර්තා නොවන නුවර ප්‍රදේශයේ ගවයන්ගේ රුධිරයේ එම ලෝහ පහළ මට්ටමක ඇත.

පදවිය ප්‍රදේශයේ බෝහොමයක් ගවයන් වැව් ආශ්‍රිතව සහ කැලෑබදව තෘණ උලාකමින් ජීවත්වන අතර එම ජලාශ මිනිසුන් සහ එම සත්වයන්ගේ ජල අවශ්‍යතාවය සපුරයි.

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ, කෘෂිකර්ම පීඨයේ, සත්වපාලන අංශයේ ජ්‍යෙෂ්ඨ ආචාර්ය එස්. පී. කොඩිතුවක්කු මහතා පවසන අයුරින් මෙම පරික්ෂණ වාර්තා එම සත්වයන්ගේ ප්‍රජනක-කායික තත්වය සම්බන්ධයෙන් පුළුල් පැතිකඩක් විවර කරන අතර ආහාරදාම හරහා මෙම ලෝහ මිනිසුන්ටද ඇතුළු වියහැකි බැවින් මෙම පරික්ෂණ වර්තා ඉදිරි අධ්‍යයන සඳහා යොමුකිරීම සුදුසුබවය. අවසාන වශයෙන් මෙම උද්ගත වෙමින් පවතින ගැටළුකාරී පරිසර දූෂණයට කඩිනම් පියවරක් ගැනීම සත්වයන් සහ මිනිසුන්ගේ පැවත්ම තහවුරු කරන බව අප සියළුදෙනා සිහිතබා ගත යුතුය යන්නය.

This is a non-technical summary of the project report titled "Circulatory metal concentrations in cattle in Padaviya and Kandy" supervised by Dr. K.K.S.P. Kodithuwakku*, Department of Animal Science.

* surangap@pdn.ac.lk



# දියර කිරි නිෂ්පාදනය කෙරෙහි ගව ප්‍රභේදය බලපාන්නේ කෙසේද ?

**පියුමි පෙරේරා**

ශ්‍රී ලංකාවේ දියර කිරි නිෂ්පාදනය පිළිබඳව සලකා බලන විට, වර්තමානය වන විට ප්‍රමාණවත් නිෂ්පාදනයක් නොමැති හේතුවෙන් ඉතා විශාල වශයෙන් කිරි පිටි ආනයනය කිරීම සිදුවේ. එසේම සංවර්ධනය වෙමින් පවතින රටක් වශයෙන් රටක් තුළ සිදු විය යුතු සාමාන්‍ය කිරි පරිභෝජනයටත් වඩා අවම වශයෙන් ලංකාව තුළ කිරි පරිභෝජනය සිදුවේ. එම නිසා ඉතා ඉහළ පෝෂණීය ගුණයකින් සමන්විත දියර කිරි නිෂ්පාදනය පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමු කිරීම ජාතික අවශ්‍යතාවක් බවට පත්ව ඇත.

දේශීය කිරි නිෂ්පාදනයේ පළාත් මට්ටමේ සැපයුම් පිළිබඳව සලකා බලන විට, වයඹ පළාත පිළිබඳව අවධානයයොමු කිරීම වටිනා කරුණකි. එයට ප්‍රධානතම හේතුව වශයෙන් දැක්විය හැක්කේ මෙම පළාත පොල් ත්‍රිකෝණයට අයත් වීමයි. මේ හේතුවෙන් බොහෝ විට සමෝධානික කෘෂිකාර්මික නිෂ්පාදන අවස්ථා සඳහා පවතින ඉඩකඩ බහුලය. පොල් වතු ආශ්‍රිතව කිරි ගවයින් ඇති කිරීම මගින් ඔවුන්ට ආහාර බහුලව සපයා ගත හැක. මේ හේතුව නිසාම වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කය යනු ලංකාවේ වැඩිපුරම කිරි ගොවීන් හඳුනා ගත හැකි ප්‍රදේශයයි. එහෙත් මෙහි කිරි නිෂ්පාදනය පිළිබඳව සලකා බලන විට සිටින කිරි ගොවීන්ට සාපේක්ෂව සිදු කරනා කිරි නිෂ්පාදනය සතුටු දායක මට්ටමක නොමැත. මෙයට ප්‍රධානතම හේතුව වන්නේ කිරි ගොවීන් සතුව වඩාත්ම සුදුසු කිරි ගව ප්‍රභේදය පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් නොමැති වීමයි. මොවුහු බොහෝ විට මධ්‍යයම කඳුකර පරිසර තත්ත්වවලට සුදුසු ගව ප්‍රභේද තම ගොවිපළ වලද ඇති කිරීමට උත්සාහ කරති. එහෙත්, එම ගව ප්‍රභේද ඔවුන්ගේ නිෂ්පාදනය උපරිම මට්ටමෙන් වයඹ පළාත් පරිසර තත්ත්ව තුළ සිදු නොකරති.

උෂ්ණත්ව සාපේක්ෂ ආර්ද්‍රතා දර්ශකය යනු පරිසර පද්ධතියක උෂ්ණත්ව හා සාපේක්ෂ ආර්ද්‍රතාවයෙහි ආවරණය මැන බැලීම සිදු කරන දර්ශකයකි. මෙහිදී වයඹ පළාත මෙම දර්ශකයෙහි 78.50ත් 82.45ත් අතර පවතින බව අනාවරණය විය. මෙම සීමාව සෞම්‍ය දේශගුණික තත්ත්ව යටතේ ඇති කරන Friesian සහ Jersey යන ගව ප්‍රභේද සඳහා සුදුසු නොවේ. ඔවුන්ගේ මෙම අගය පිළිවෙලින් 68 සහ 75 ලෙස අධ්‍යයන මගින් අනාවරණය කර ඇත. නමුත් දෙමුහුන් කිරි ගව ප්‍රභේද නිවර්තන දේශගුණික තත්ත්ව පවතින වයඹ පළාත අයත් ප්‍රදේශවලට වඩාත් සුදුසු වේ. ඔවුන් සතුව ලෙඩ රෝගවලට ඔරොත්තු දීමේ හැකියාවද ඉතා ඉහළය.

පහත වගුව මගින් වයඹ පළාතෙහි ප්‍රදේශ කිහිපයක විවිධ ගව ප්‍රභේදවල පිරිවැය ප්‍රතිලාභ අනුපාතය දැක්වේ. ඉතින් ඔබට සුදුසු ගව ප්‍රභේදය කුමක්දැයි තීරණය කිරීමට තවත් මැලි වන්නේ ඇයි??

| ප්‍රභේදය / ප්‍රදේශය | Friesian× Sahiwal | Jersey× Sahiwal | Sahiwal |
|---|---|---|---|
| වනාතවිල්ලුව , මාහෝ | 1:2 | 1:4 | 1:6 |
| කුරුණෑගල, ඉබ්බාගමුව | 1: 5.6 | 1: 5.6 | 1:4 |
| ලුණුවිල, මාරවිල. | 1: 4.2 | 1:4.5 | 1:4.5 |

ඉහත වගුව මගින් Friesian හා Jersey ප්‍රභේදයන්ගේ දෙමුහුම් සතුන් වයඹ පළාතෙහි කුරුණෑගල, ලුණුවිල ආශ්‍රිත ප්‍රදේශ වලට වඩාත් සුදුසු බව ඔබට වැටහෙනු ඇත. ඉතින් ඔබ Friesian හෝ Jersey සතෙක් වනාතවිල්ලුව වැනි ප්‍රදේශයක ඇති කිරීම මගින් ඔබ බලාපොරොත්තු වන ආකාරයෙන් කිරි නිෂ්පාදනයක් ලබා නොදෙනවා කමන්ම ඔබේ ප්‍රතිලාභයද අඩු වේ. Sahiwal සතෙකු එම ප්‍රදේශයෙහි ඇති කිරීම වඩා වාසි දායක බව ඔබට දැන් වැටහෙනු ඇත.

මේ අනුව Friesian× Sahiwal දෙමුහුම පළාතෙහි මැද රට සහ පහත රට තෙත් කලාපීය ප්‍රදේශවලටද, Jersey× Sahiwal දෙමුහුම පළාතෙහි පහතරට අතරමැදි කලපීය ප්‍රදේශ සහ මැද රට සහ පහත රට තෙත් කලාපීය ප්‍රදේශ වලටද, Sahiwal පහත රට වියළි කලාපීය ප්‍රදේශ වලටද අර්ධ සුක්ෂම තත්ත්ව යටතේ ඇති කිරීම මගින් වඩා ඉහළ කිරි නිෂ්පාදනයක් අඩු පිරිවැයකින් ලබා ගත හැක.

This is a non-technical summary of the project report titled “Development and use of temperature humidity index for cattle types in North Western province, Sri Lanka” supervised by Prof. G.L.L.P. Silva*, Department of Animal Science.

* pradeepas@pdn.ac.lk



# අතමිට සරු හෙට දිනකට නිරෝගී ගම්මිරිස් පැල නිෂ්පාදනය කරමු

**මහේෂ් රූපසිංහ**

ගම්මිරිස් පැල නිෂ්පාදනයේදී ගම්මිරිස් පැල මැක්කාගේ (*Liothrips karnyi*) හානිය පැල වර්ධනයට මෙන්ම ඉල්ලුමටද බලපනු ලබයි. තවාන් ගෘහ තුළ ඇති සෙවණ ගම්මිරිස් පැල මැක්කාගේ හානියේ තීව්‍රතාවයට බලපානු ලබන අතර ඉහල සෙවන තත්ත්වයන් (60% ට වැඩි) තීව්‍රතාවය වැඩි කිරීමට හේතු වන අතර සෙවණ 50% - 60% අතර පවත්වා ගැනීමෙන් තීව්‍රතාවය අවම මට්ටමක පවතින බව මෙම අධ්‍යනය තුළින් පැහැදිළි වේ.එසේම ගම්මිරිස් අතුකැබලි මුල් අද්දවා පැල ලබා ගැනීමෙ ආර්ද්‍රතා කුටිර ක්‍රමය භාවිතා කිරීම මගින් ඉහල සාර්ථක භාවයක්(100%) ලබාගත හැක.

කුලුබඩු ලොව රජු ලෙසින් හඳුන්වනු ලබන ගම්මිරිස් (*Piper nigrum* L) ලංකාවේ ඉහළ වටිනාකමක් ඇති අපනයන බෝගයක් ලෙස සැලකිය හැක. ඉහල වටිනාකම හේතුවෙන් ගම්මිරිස් වගා කිරීමෙන් ඉතා ඉහළ ආදායමක් ලබාගැනීමේ හැකියාව ඇත.මේ හේතුව නිසා දැනට හෙක්ටයාර් 32000 ක් පමන වන ගම්මිරිස් වගා කරනු ලබන බිම් ප්‍රමානය 2020 වසර වනවිට හෙක්ටයාර 43000 දක්වා වර්ධනය කිරීම අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඉලක්කය වී ඇත. ඉහත ඉලක්කය සපුරා ගැනීම සඳහා ඉහල ගුණාත්මක භාවයෙන් යුතු නිරෝගී, නිර්දේශිත රෝපන ද්‍රව්‍ය සපයා ගැනීම කල යුතුය. මේ හේතුවෙන් ගම්මිරිස් රෝපන ද්‍රව්‍ය සඳහා ඉල්ලුම ශීග්‍ර ලෙස වර්ධනය වනු ඇත. ගම්මිරිස් පැල නිෂ්පාදනය සඳහා ආර්ද්‍රතා කුටිර ක්‍රමය නිර්දේශ කරන අතර සති හතරක් වැනි කාලයකදී පොලිතීන් ආවරණ ඉවත් කිරීම සිදුකල යුතුය.හොඳින් මුල් හා රිකිලි වර්ධනය සඳහා ඉහත ලබාගත් පැල මාස තුනක් පමණ සෙවණ ගෘහ තුල තැබිය යුතු අතර ඒ සඳහා 50% සෙවණ නිර්දේශ කෙරේ. ඉහත සෙවණ යටතේ පැල වල මුල් හා රිකිලි වර්ධනය හොඳින් සිදු වේ.



**ගම්මිරිස් පැල නිෂ්පාදනය සඳහා ආර්ද්‍රතා කුටිර ක්‍රමය භාවිත කිරීම**

සෙවණ ගෘහ සැකසීම සඳහා පැල නිෂ්පාදකයින් විවිධ ද්‍රව්‍ය භාවිත කරන අතර කෘතිම සෙවණ දැල් භාවිතය වඩාත් ප්‍රචලිත ක්‍රමය වේ. නමුත් නියමිත පරිදි සෙවණ නොලැබීම නිසා ගම්මිරිස් පැල වල විවිධ දුර්වලතා දැකිය හැක. විශේෂයෙන්ම අධික ආර්ද්‍රතාවය හා ඉහළ උෂ්ණත්වය ගම්මිරිස් තවාන් පැල වල රෝග පලිබෝධ ඇතිවීමට හේතුවක් වේ. පලිබෝධ සැලකීමේදී ගම්මිරිස් පැල මැක්කාගේ හානිය ප්‍රධාන වන අතර පත්‍රවල දාරයේ යුෂ උරාබීම හේතුවෙන් දාර ඇතුළට හැකිලීම සිදු වේ.මෙම හානිය තවාන් පැල වර්ධනය බලපාන අතර පැල ඉල්ලුම සඳහා ද බලපානු ලබයි.

සෙවණ ගෘහ තුළ ඒකාකාරී ආලෝකයක් නොලැබීමට විවිධ හේතු බලපාන අතර අවට ඇති ශාඛවල අතු සෙවණ ගෘහයට ඉහළින් වර්ධනය වීම, ප්‍රමිතියෙන් තොර සෙවණ දැල් භාවිතා කිරීම, ලයිකන විශේෂ දැල් මත වර්ධනය වීම හා සෙවණ දැල් වලට හානි සිදුවීමද ප්‍රධාන වේ. මනා ලෙස කළමණාකරනය තුළින් ඉහත ගැටලු මග හරවා ගත හැකි අතර රෝග පලිබෝධ වලින් තොර ගුණාත්මක ගම්මිරිස් පැලයක් ලබා ගත හැකි වේ.





**විවිධ හේතු සෙවණ වෙනස් වීමට බලපාන අයුරු**

This is a non-technical summary of the project report titled “Occurrence of pest and diseases and survival rate of black pepper (*Piper nigrum* L.) plants in humid chambers and shade houses” supervised by Dr. W.H. Jayasinghe* and Dr. K.S. Hemachandra, Department of Agricultural Biology.

* whjayasinghe@gmail.com



# කේක් නිෂ්පාදන ක්‍රියාවලියේදී නිෂ්පාදන වල බර ඒකාකාර නොවීමේ පැනයට විසඳුමක්

**පියුමිකා සමනලී**

**මෑ**තකදී සිදුකරන ලද අධ්‍යයනයකින් පැහැදිලි වූයේ, වාණිජමය වශයෙන් ස්පොන්ච් කේක් නිෂ්පාදනය සිදුකරන නිෂ්පාදන ක්‍රියාවලියන්හි අවසන් නිෂ්පාදිතයේ බර ඒකාකාර නොවීමට හා බර නියමිත අගයන්ට වඩා වැඩිවීමට විදුලි උඳුන තුළ පවතින තාප ව්‍යාප්තිය හා කේක් තැටිය මතට දමන කේක් මිශ්‍රණයේ අවසන් උස හෙවත් ඝනකම බලපාන බවය.මේ නිසා නිෂ්පාදන ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය අඩුවීම හා අදාල නිෂ්පාදන ඉලක්කවලට ළඟා නොවීම හේතුවෙන් ස්පොන්ච් කේක් නිෂ්පාදකයින්ට ආර්ථිකමය ලෙස අවාසිදායක තත්වවලට මුහුණ දීමටසිදුවේ.මෙය ඔවුනට මුහුණ දීමට සිදුවන ප්‍රධාන අභියෝගයකි.

මහා පරිමාණ ස්පොන්ච් කේක් නිෂ්පාදන ක්‍රියාවලිය තුළ ප්‍රධාන නිෂ්පාදන අදියර කිහිපයකි.ඒවා නම්,කේක් මිශ්‍රණය සකසා ගැනීම,මිශ්‍රණය වාතනය හෙවත් ඊට පිරිසිදු වායුව එක්කර පරිමාව වැඩිකිරීමට අවශ්‍ය තත්ත්වසපයා දීම,සකසා ගත් කේක් මිශ්‍රණය පිලිස්සුම්තැටිය මත එකම ඝනකමකින් විසුරුවාලීම, මිශ්‍රණය පුළුස්සා ගැනීම හා පුළුස්සා ගත් කේක් සිසිල්කර අවශ්‍ය දිග-පළල අනුව කපා ගැනීම ආදියවේ.

මෙලෙස අදියර කිහිපයකින් සැකසෙන ස්පොන්ච් කේක් නිෂ්පාදන වල බර වැඩිවීම කෙරෙහි බලපාන සාධක ලෙෂ අමුද්‍රව්‍යවල ගුණාත්මකභාවය, අමුද්‍රව්‍ය මිශ්‍ර කිරීමේ ක්‍රියාවලි තත්ත්ව,කේක් මිශ්‍රණය වාතනය කිරීමේ හා තැටිය මත විසුරුවාලීමේ තත්ත්ව,විදුලි උඳුන තුළ රැඳී පවතින කාලය හා තාප ව්‍යාප්තිය,අවසන් නිෂ්පාදනය කපා සකසා ගැනීමේ ආකාරය ආදියවේ.

මෙම අධ්‍යයනය තුළ පෙනී ගියේ,එකම අමුද්‍රව්‍ය යොදා ගනිමින්,එකම නිෂ්පාදන ක්‍රියාවලි තත්ත්ව යටතේ නිෂ්පාදනය කරන ලද ස්පොන්ච් කේක් වල බර නියමිත අගයට වඩා වැඩි වී ඇති බවය.අදාළ අධ්‍යයනය තුළ නිෂ්පාදිත කේක් වල ඝනත්වය ඒකාකාර වී ඇති අතර බර වැඩිවීම කෙරෙහි ප්‍රධාන ලෙසම බලපා ඇත්තේ කේක් වල පරිමාව වෙනස්වීම බව තහවුරු වී ඇත.

මෙහිදී කේක් වල දිග හා පළල යන මිණුම් එකම  අගයක් ගෙන ඇති අතර උසෙහි වෙනස්වීම හා එම අගය වැඩිවීම,පරිමා වැඩිවීමට බලපා ඇති බව පෙනී ගොස් ඇත. තවද එකම නිෂ්පාදන තත්ත්ව යටතේදී එකම අමුද්‍රව්‍ය යොදා ගනිමින් කළ නිෂ්පාදනවල,මෙලෙස උස හෙවත් කේක් වල ඝනකම වැඩිවීමට විදුලිඋඳුනේ තාප ව්‍යාප්තිය හා කේක් තැටිය මත මිශ්‍රණය විසුරුවාලන උස බලපාන බව පැහැදිලිවී ඇත.

මහා පරිමාණ කේක් නිෂ්පාදන වලට යොදා ගන්නා විදුලි උඳුන් වල උෂ්ණත්ව-කාල සම්බන්ධතාවය හෙවත් කේක් මිශ්‍රණය උඳුන තුළ රැඳී පවතින කාලය හා එවිට එහි උෂ්ණත්වය, නිර්ණය කරනුයේ කේක් මිශ්‍රණයේ සංයුතිය හා නිෂ්පාදිතයේ භෞතික මිණුම් (දිග, පළල, උස)සැලකීමෙනි.මේවා ස්වයංක්‍රීයව හෝ අර්ධ ස්වයංක්‍රීය ව සිදුවන නිෂ්පාදන ක්‍රියාවලි නිසා, අදාල පාලන තත්ත්ව නිෂ්පාදනය ඇරඹීමට පෙර සකසනු ලබයි.

අදාළ අධ්‍යයනයේදී සිදුකරන ලද පරීක්ෂණ වලින් පැහැදිලි වූයේ,නියමිත ඝනකමට වඩා වැඩි ඝනකම කින් යුත් කේක් මිශ්‍රණයක්, උඳුන තුළ පිලිස්සීමේදී අවශ්‍ය පරිදි පිලිස්සීම සිදුනොවන බවය.වැඩි උසකින් යුතු මිශ්‍රණයෙන් ජල වාෂ්ප ඉවත්වනුයේ පෙර සැකසූ ප්‍රමාණවලින්මය.මේ නිසා වැඩිපුර ඇති ජල වාෂ්ප මගින් උඳුනේ පිලිස්සුම් කුටීරයේ උෂ්ණත්වය වෙනස්වීම හෙවත් අඩුවීම සිදු වී කේක් මිශ්‍රණයට තාපය ඒකාකාර නොලැබීම හෙවත් කුටීරය තුළ තාප ව්‍යාප්තියේ අසමතුලිතතාවය හේතුවෙන් අවසානයෙ,' කේක් නිෂ්පාදිතවල බර වැඩිවීම සිදුවන බවත්,එය අවමකර ගැනීමට ගත හැකි පහසුම විසඳුමක් ලෙස කේක් මිශ්‍රණය,පිලිස්සුම් තැටිය මත විසුරුවාලීමේ උස අඩුකිරීම දැක්විය හැකි බව අධ්‍යයනයේ දී  තහවුරුවී ඇත.

This is a non-technical summary of the project report titled “Studying the process line of a commercial sponge cake manufacturing plant to identify the steps that lead to overweight final products” supervised by Dr. C.A. Hettiarachchi*, Department of Food Science and Technology.

* charithuop@yahoo.com



# වනයේ තුරුලතා අතර හැඩකාරී බිනර

මහේෂා සේනාරත්න

ශ්‍රී ලංකාවේ කඳුකර තෙත් කලාපීය වනාන්තරවල ස්වභාව සෞන්දර්යට නව ජීවයක් එක්කරමින් තම සුවඳ දසත විහිදුවාලමින් වනයේ හැඩකාර කුමරිය බඳු වූ බිනර ශාකය දැන් ඔබේ ගෙවත්ත, ඔබේ ආලින්දය අලංකරණයට සූදානම්ය. ඇතැම් ප්‍රදේශවල ගිනිහිරිය ලෙසද හඳුන්වන මෙම ශාකය හන්තාන, පට්ටිපොළ, අඹේවෙල, හක්ගල,හෝර්ටන් තැන්න හා පිදුරුතලාගල ආදී කඳුකර තෙත් කලාපයන්හි බහුලව වැඩෙන අතර එක්සෙකම් ට්‍රයිනර්වියම් (*Exacum trinervium)* එහි විද්‍යාත්මක නාමය වේ. ශ්‍රී ලංකාවට පමණක් ආවේණිකවූ බිනර තද නිල් පැහැයෙන් යුතු මල් නිසා එය ශාක ලෝකයේ අලංකාරය මනාවට ගෙනහැරපායි. මෙම ශාකයේ වසර පුරා මල් හටගන්නා අතර බිනර මාසයේදී විශාල මල් ප්‍රමාණයක් හටගන්නා බව පැරැන්නන්ගේ මතයයි.

තර්ජනයට ලක්වෙමින් පවතින මෙම ශාකයේ ප්‍රචාරණය පිළිබඳ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ භෝග විද්‍යා දෙපාර්තුමේන්තුවේ පටක රෝපණ අංශය මඟින් නව සොයාගැනීම් සිදුකර ඇත. ඒඅනුව පටකරෝපණය මඟින් බිනර පැල පහසුවෙන් ලබාගත හැක. නමුත් අතු නොබෙදී මීටර එකක් පමණ උසට වැඩෙන මෙම ශාකය බඳුන් වගාව සඳහා යොදාගැනීමේදී ගැටළු මතුවේ. එනිසා මෙම ශාකය මල් වගා කර්මාන්තයට හඳුන්වාදීමේදී උසින් අඩු, මල් පිරුණු අලංකාර බඳුන් ගත ශාකයක් සාදාගැනීම අවශ්‍යතාව වේ.පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ භෝග විද්‍යා දෙපාර්තුමේන්තුව විසින් මේ පිළිබඳව තව දුරටත් පර්යේෂණ සිදු කරන ලදී.ශාකයේ අතු ප්‍රමාණය වැඩිකරගැනීම සඳහා දල්ල කඩා ඉවත්කිරීම බහුලව භාවිතා කරන අතර එමඟින් ශාකයේ පැති අතුවල වර්ධනය සිදුවේ.එය ශාකයේ අතු ප්‍රමාණය වැඩි -කරන අතර ශාකයේ මල් ප්‍රමාණයද වැඩිකරනු ලබයි. පැක්ලබියුට්‍රසොල් (Paclobutrazole) යනු ශාකවල වර්ධනය අඩුකිරීමට මල් වගාවේදී බහුලව භාවිත කරන වර්ධන මන්දකයකි (Growth retardant). ඒවගේම පැක්ලබියුට්‍රසොල් යෙදීම මඟින් මල් පිපිම ඉක්මන් කරන අතර ශාකයේ මල් ප්‍රමාණයද වැඩි කරයි.මෙම රසායනික සංයෝගය පරිසරයට අහිතකර නොවීම  තවත් විශේෂයකි.

ඒ අනුව බිනර මල් පිරුණු අලංකාර බඳුන්ගත විසිතුරු ශාකයක් ලෙස හඳුන්වාදීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ විය. පළමුව, ශාකය කුඩා අවදියේදී (මසක් පමණ වයසැති) මුදුන් දල්ල කඩා ඉවත්කරන ලදී. එම ශාකයට නියමිත පරිදි පොහොර හා ජලය ලබාදෙමින්නඩත්තු කිරීම අනිවාර්‍ය විය.ශාකයේ මුදුන්දල්ල ඉවත්කර සති අටකට පසුව ලීටරයට මිලි ග්‍රෑම් 20 සාන්ද්‍රණයෙන් යුතු පැක්ලබියුට්‍රසොල් ද්‍රාවනයෙන් මිලි ලීටර 25ක් ශාකයට යෙදූ අතර ඉන් පසුව ශාකයේ වර්ධනය ලෙස අඩු විය.

ශාකයේ මුදුන් දල්ල ඉවත් කල විගසම පැක්ලබියුට්‍රසොල් යෙදීම මඟින් ශාකයේ වර්ධනයක් දැකිය නොහැකි අතර ශාකය විකෘති ස්වභාවයක් ගනී.

මෙම පර්යේෂණයට අනුව ශාකයේ කුඩා අවදියේදී මුදුන් දල්ල කඩා ඉවත්කිරීම මඟින් පැති අතු වර්ධනය වීම දිරිමත්වන අතර එමගින්ද ශාකයේ උස යම් ප්‍රමණයකට අඩු කරගත හැක. තවද ශාකයේ අතු ප්‍රමාණයද වැඩි විය.ශාකයේ මුදුන් දල්ල කඩා ඉවත් කිරීම මඟින් පමණක් සැලකියයුතු ලෙස ශාකයේ උස අඩුවීමක් සහ පඳුරු ස්වභාවයහි වැඩි වීමක් දක්නට නොලැබේ. එමනිසා දල්ල කඩා ඉවත්කර සති 08ක් ගතවූ පසුව පැක්ලබියුට්‍රසොල් යෙදීම මඟින් බිනර  විසිතුරු බඳුන් ගතකුරු ශාකයක් ලෙස නිර්මාණය කරගත හැක. ඒ වගේම මාස 03ක් වැනි කෙටි කාලයකදී ශාකයේ මල් හටගන්නා අතර මල් ප්‍රමාණයද 140% කින් වැඩිවිය.

This is a non-technical summary of the project report titled "Effect of pinching and Paclobutrazol on growth and flowering of Binara (*Exacum trinervium*)" supervised by Prof. J.P. Eeswara*, Department of Crop Science.

* jpe@pdn.ac.lk



# කසල තේ මගින් සාර්ථක ගැඩවිල් පොහොරක්

කසුන් චානක

ඵලදායී අස්වැන්නක් ලබාගැනීම සඳහා වර්තමාන ගොවියා කෘෂි රසායන කෙරෙහි නැඹුරුතාවයක් දක්වයි. ඒ අතරින් රසායනික පොහොර කෙරෙහි ඇත්තේද ප්‍රමුඛ ස්ථානයකි. නමුත් කාබනික පොහොර භාවිතය පිළිබඳව වර්තමාන ජාතික ප්‍රතිපත්තීන් පිවිසීමත් සමගම ශ්‍රී ලංකීය ගොවියා කොම්පෝස්ට් වැනි ස්වභාවික කාබනික ප්‍රතිකර්ම කෙරෙහි අවධානය යොමු කරමින් පවතී.

එහෙත් සාමාන්‍ය කොම්පෝස්ට් පොහොරකින් වගාවට අත්‍යවශ්‍ය පෝෂක අත්‍යවශ්‍ය අවස්ථාවලදීම ලබාදීම කළ නොහැක්කකි. එහි පින ඇතැම් පෝෂක ශාකයට සෘජුවම ලබාගත නොහැකි වීම මෙයට හේතුවයි.

මේ සඳහා විසඳුමක් වශයෙන් ස්වාභාවික පරිසර පද්ධතිවලදී හමුවන ගැඩවිල් පස පිළිබඳ අවධානය යොමුකරමින් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨය මගින් ගැඩවිල් පොහොර හා එහි ගුණාත්මකභාවය පිළිබඳ පරීක්ෂණ පවත්වා ඇත. මේ සඳහා යොදාගනු ලැබුවේ තේ වගාවේ අපද්‍රව්‍ය ලෙස වගා භූමියෙන් ඉවතලන ද්‍රව්‍යයයි. තවද විශේෂ තුනකින් යුත් ගැඩවිල් පණුවන් යොදාගෙන පෝෂක ගුණයෙන් වැඩිම ප්‍රමාණයක් සහිත ගැඩවිල් පොහොරක් නිශ්පාදනයට හැකි බව තහවුරු වී පවතී.

මේ පිළිබඳ වැඩිදුර සනාථ කිරීම සඳහා ගැඩවිල් පොහොර, සාමාන්‍ය කොම්පෝස්ට් සහ අකාබනික පොහොර කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිර්දේශය යොදා ගනිමින් තක්කාලි පැලවලට යොදා කළ පරීක්ෂණයෙන්ද ගැඩවිල් පොහොර අකාබනික නිර්දේශය පවා අභිබවා යමින් වැඩි ධනාත්මක ප්‍රතිඵල ලබාදෙන ලදි. මල් පිපීම, අතුබෙදීම, අස්වැන්න සහ අස්වැන්නේ ගුණාත්වය යන සාධකවලින් ගැඩවිල් පොහොර ධනාත්මක ප්‍රතිඵල සාපේක්ෂ ලෙස ඉහළ මට්ටමකින් ලබාදෙන ලදි.

ස්වභාවික පසේ ව්‍යූහය දියුණු කරමින් ප්‍රධාන පෝෂකවලට අමතරව ක්ෂුද්‍ර පෝෂක රාශියක් දායක කිරීමට හැකියාව ඇති කොටිඨාශයක් වශයෙන් ගැඩවිලන් හඳුන්වා දිය හැක. ශාක වර්ධනයට අවශ්‍ය වර්ධක හෝර්මෝන, රෝගවලට ඔරොත්තු දීමේ හැකියාව විශේෂයෙන්ම දිය මරං කෑම ගැඩවිල් පොහොරේ අන්තර්ගතය. පරිසරයේ බහුලවම පවතින මෙවැනි සම්පත් කෘෂිකර්මාන්තයේ දියුණුවට යොදාගැනීම ඉතාමත් කාලෝචිතය.



This is a non-technical summary of the project report titled “Evaluation of Vermicompost produced using common earthworm species and waste materials collected from tea estates” supervised by Dr. H.M.G.S.B. Hitinayake*, Department of Crop Science.

* gaminih@pdn.ac.lk

# වල්කොලොන්දු : 3 in 1

තනුජා වීරසේකර

ශ්‍රී ලංකාවේ ප්‍රධාන වතු භෝගයක් වන තේ වගාව වර්තමානය වන විට විවිධ ගැටලු වලට මුහුණ දෙමින් පවතී. ඒ අතරින් කෘෂි රසායන ද්‍රව්‍ය අධි භාවිතයත් සමග ඇති වූ ගැටලු බොහෝය. නමුත් තේ පළිබෝධකයන් මර්ධනය සඳහා පහසුම හා කෙටිම මාර්ගය ලෙස වගාකරුවන් මේ වන විට කෘෂි රසායන ද්‍රව්‍ය කෙහෙි දක්වන්නේ දැඩි ඇල්මකි. මේ තත්වය යටතේ පරිසර දූෂණය, රසායන ද්‍රව්‍ය තේ දල්ලේ සංචිතවීම සමගම ප්‍රතිරෝධී ප්‍රබේද බිහිවීම වර්තමානයේ උග්‍ර තත්වයේ පවී. මේ වන විට ග්ලයිපොසේට් පැරකොට් ඇතුලු බහුතරයක් කෘසි රසායන තහනම් වී ඇතත් ගොවීන් රසායන ද්‍රව්‍ය කෙරෙහි ඇති නැඹුරුතාවය නම් නවතා හැක. සරලම හා කෙටිම විසදුම ලෙස මෙය ගොවීන්ගේ කෝණයෙන් බැලූ විට සාධාරණ නමුත් කෘතිම රසායන ද්‍රව්‍ය යොදාගැනීමට විකල්ප ක්‍රමයක් සොයාගැනීම යුගයේ අවශ්‍යතාවයයි.

උඩරට ඇතැම් තේ වගාකරුවන් වැටි වශයෙන් වගා කරන වල් කොලොන්ද්‍ු (*Artemisia vulgaris*) Asteracea පවුලට අයත් සුවඳවත් පැළෑටියකි. කෘමිනාශකයක්, වල්නාශකයක් මෙන්ම කෘමි පළිබෝධ පලවා හැරීන ලක්‍ෂණ ත්‍රිත්වාකාරය පිලිබඳ ගොවීන්ගේ මෙන්ම විද්‍යාඥයන්ගේ ද අවධානය මෙතෙක් මෙරට තුල සිදු නොවූවකි. නමුත් මෑතකදී පේරාදෙණි විශ්ව විද්‍යාලයේ කෘසිකර්ම පීඨය මගින් සිදුකරන ලද පරීක්ෂණයක් මගින් එම ලක්ෂණ ත්‍රිත්වය අනාවරණය කරන ලදි.

තේ වගාව සමග තරගකාරී පළල් පත්‍ර වල් පැළෑටියක් ලෙස අලවිංගුපිල්ලි සලකමින් පූර්ව නිගමන හා පශ්චාත් නිර්මන අවස්ථා වලදී වල් මර්ධනයට මෙම ශාක සාරය යොදාගත හැකි බව මූලික පර්යේෂණ මගින් සනාථ කර ඇත. තවද මදුරු කීටයන් යොදාගන කල මූලික පර්යේෂණ මගින් මෙහි ඇති කෘමිනාශක ලක්‍ෂණ අනාවරණය කර ඇති අතර එය යොදාගෙන තේ කුඩිත්තන් මර්ධනය කල හැකි බවද තහවුරු කර ඇත. තවද තෙත් කලාපීය තේ වතු ආශ්‍රිත කම්කරුවන්ගේ කාර්යක්ෂමතාව අඩු කිරීමට බලපාන සාධකයක් වන කූඩැල්ලන් විකර්ශනයට පිලියමක් ලෙස මෙය යොදාගත හැක. වැඩිදුරටත් මෙම ශාකය පිලිබඳ කල පර්යේෂණ මගින් එය තුල වල්නාශක රසායන ද්‍රව්‍ය ලෙස (6,9-Octadecadienoic acid සහ Heptanoic acid), මෙය යොදා ගත හැක. වැඩිදුරටත් මෙම ශාකය පිලිබඳ කල පර්යේෂණ මගින් එය තුල වල්නාශක රසායන ද්‍රව්‍ය ලෙස කෘමිනාශක රසායන ද්‍රව්‍යයක් ලෙස Germacrene සහ කෘමි විකර්ශකයක් ලෙස Taraxasterol ඇති බව සනාථ කරන ලදි. කාබනික විකල්ප ක්‍රමයක අවශ්‍යතාව තදින් දැනෙන යුගයක ස්වාභාවික ශාක සාරය් ොදාගෙන තේ වගාවේ ගුණාත්මය හා කම්කරු කාර්යක්සමතාව ආරක්සා කිරීම ඉතාමත් වැදගත් බැවින් ඉතාම කාලෝචිතය.







This is a non-technical summary of the project report titled “Identification of Herbicidal and Insecticidal properties of *Artemisia vulgaris* L. : A hedgerow-plant in tea plantations” supervised by Prof. B. Marambe, Department of Crop Science.



# පේරාදෙණිය කෘෂිකර්ම පීඨයෙන් කාර්යක්ෂමව කෘෂි තොරතුරු සන්නිවේදනයට නව රූපවාහිනී ප්‍රවෘත්ති ආකෘතියක්

අසංක විජේසේකර



කෘෂිකර්මාන්තය රටෙහි ආර්ථිකය සඳහා සුවිශේෂී කාර්ය භාරයක් සිදුකරන අතර 28% කට ආසන්න ශ්‍රම දායකත්වයක් ඒ තුළින් රටෙහි ආර්ථිකයට දායක වේ. කෘෂිකර්මය ආශ්‍රිත තොරතුරු ව්‍යාප්ත කිරීම සඳහා මේ වන විට ලෝකයේ විවිධ ක්‍රමවේද භාවිත කරන අතර ජනසන්නිවේදන ක්‍රමය ඒ අතුරින් සාර්ථකව භාවිත කෙරේ. මෙම ක්‍රමවේදය යටතේ රූපවාහිනිය, සන්නිවේදන මාධ්‍යක් ලෙස බහුලව භාවිත කරනු ලැබේ. ශ්‍රී ලංකාව සැලකීමේදී ග්‍රාමීය ගෘහ ඒකක 79%කම රූපවාහිනි යන්ත්‍ර පවතින අතර නාගරික ගෘහ සියල්ලගේම රූපවාහිනි යන්ත්‍ර පවතින බව ආසන්නතම සමාජ විද්‍යා පර්යේක්ෂණ මගින් අනාවරණය වී තිබේ. ශ්‍රී ලංකාව තුළද කෘෂි සන්නිවේදනය සඳහා රූපවාහිනි මාධ්‍ය භාවිත කළද එම ක්‍රමවේද තුළින් නිසි වේලාවට සහ නව තොරතුරු ගොවි ජනතාව වෙත සන්නිවේදනය වීමේ ක්‍රියාවලියේ දුබලතා ඇතැම් පර්යේක්ෂකයන් සොයාගෙන තිබේ.

මේ අනුව කෘෂිකාර්මික තොරතුරු සන්නිවේදනය සඳහා මෙම අධ්‍යනය මගින් නව රූපවාහිනි ප්‍රවෘත්ති ආකෘතියක් හඳුන්වාදී ඇති අතර එම ආකෘතිය පාර්ශව කිහිපයක් හමුවේ ඇගයීමට ලක්කිරීම තුළින් මෙය රූපවාහිනී ප්‍රවෘත්ති විකාශයක් සමග විකාශනය කිරීමේ ශක්‍යතාව තහවරු කිරීම සිදුකර ඇත.

එමෙන්ම රූපවාහිනි මාධ්‍ය තුළ විකාශය කෙරෙන ආකෘති අතරින් ටෙලි නාට්‍ය සහ ප්‍රවෘත්ති වැඩසටහන් ඉතා ඉහළ ප්‍රෙක්ෂක ආකාර්ෂණයක් දිනා ගෙන තිබෙන අතර එබැවින් කෘෂිකාර්මික කොරතුරු සන්නිවේදනයට ප්‍රවෘත්ති ආකෘතියක් නිපදවීම තුළින් එම සන්නිවේදන ක්‍රියාවලිය වඩාත් ඵලදායිවනු ඇත.

විද්‍යාත්මක ක්‍රමවේදයක් ඔස්සේ සිදුකරන ලද මෙම පර්යේක්ෂණයේ ප්‍රතිඵල අනුව යෝජිත ප්‍රවෘත්ති කණ්ඩය මිනිත්තු 15% සිට 25%ක කාලයකට සැලසුම් කළ යුතු බව සහ අදාළ ප්‍රවෘත්තියට සම්බන්ධ සියලු පාර්ශවකරුවන්ගේ අදහස් සඳහාද ඉඩ කඩක් ලබා දෙමින් සමබරව නිෂ්පාදනය කළ යුතු බවට නිර්දේශ විය. එමෙන්ම මෙහිදී භාවිත කෙරෙන දර්ශනවල ගුණාත්මකභාවය සහ පසුබිම් කථනයට එම දර්ශන ගැළපීම ඉතා වැදගත් බවද සඳහන් විය.

එමෙන්ම මෙම පර්යේපණය තුළින් ගොවි සමාජයේ මූලික තොරතුරු කිහිපයක් අනාවරණය කරගන්නා ලද අතර ගොවි ප්‍රජාවගෙන් 84%ක් පමණ රූපවාහිනි ප්‍රවෘත්ති නරඹන බව සහ ඉන් 67%ක පිරිසක් දිනපතා ප්‍රවෘත්ති නරඹන බව අනාවරණය විය. මෙම ප්‍රතිඵල ආශ්‍රයෙන් ගොවීන් කරා කෘෂිකාර්මික තොරතුරු සන්නිවේදනයට යෝජිත රූපවාහිනි අකෘතිය ඵලදායිවන බව නිගමනය කළ හැකි විය. එමෙන්ම ප්‍රවෘත්ති ආකෘතිය සංවිධානය කිරීමට නිෂ්පාදනය කරන ලද පළමු ප්‍රවෘත්ති කණ්ඩය ඇගයීමට ලක් කිරීමෙන් ලද ප්‍රතිඵල අනුව, ගොවි ජනතාව මෙවැනි ප්‍රවෘත්ති කණ්ඩයක් නැරඹීමට දැඩි කැමැත්තක් සහ අවශ්‍යතාවකින් පසුවන බවද සොයාගන්නා ලදී.

මාධ්‍ය ව්‍යාපාරයේදී වැඩසටහන්වල පැවැත්ම, ඒ සඳහා ලැබෙන ප්‍රේක්ෂක ආකර්ෂණය සහ නිෂ්පාදන වියදම මත රඳා පවතිනු ලැබේ. පර්යේපණ ප්‍රතිපල අනුව මේ සඳහා අධික ප්‍රේක්ෂක ප්‍රසාදයක් හිමිවන බව නිගමනය කළ හැකි අතර අනෙකුත් රූපවාහිනි ආකෘතිවල නිෂ්පාදන වියදමට සාපේක්ෂව ඉතා අඩු මුදලකින් නිෂ්පාදනය කළ හැකි වීම නිසා නුදුරු අනාගතයේදීම මාධ්‍ය කර්මාන්තය තුළ මෙම ආකෘතිය වඩා ලාභ දායි සහ ඵලදායි ආකෘතියක් ලෙස යොදා ගනු ඇත.

This is a non-technical summary of the project report titled "Developing and testing a television news format to disseminate agricultural information in Sri Lanka" supervised by Ms. U.I. Dissanayake*, Department ofAgricultural Extension.

* uvasarad@pdn.ac.lk



# எத்தனை பேர் கால்நடை உணவாக தவிட்டை பயன்படுத்துகின்றீர்கள்?

*சாமந்தி சொக்கலிங்கம்*

**உங்களுக்கு தெரியுமா தவிட்டில் உள்ள கொழுப்பு எவ்வளவு பெறுமதியானது என்று?**

இறைச்சி, முட்டை, பால் உற்பத்தி, கருவுறும் வீதம் மற்றும் உடல் ஆரோக்கியம் அதிகரிக்க உதவுகிறது.




தவிடு உற்பத்தி செய்யப்பட்ட பொழுதில் இருந்து கொழுப்பு சத்து கெடுதல் அடைய ஆரம்பிக்கிறது. இதன் விளைவாக தகாத மணம், கசப்பு சுவை, அமிலத் தன்மை உருவாகின்றது. இது நேரடியாக அரிசி ஆலை நடத்துனர்களையும், கால்நடை விவசாயிகளையும் பொருளாதர ரீதியாக பாதிக்கின்றது.

கெடுதல் அடையும் வீதம் ஆரம்ப காலத்தில் மிகவும் அதிகமாக உள்ளது . ஒருமாத கால முடிவில் 75% கொழுப்பு கெடுதல் அடைக்கின்றது. எனவே இதனை கட்டுப்படுத்துவது அவசியமாக உள்ளது.

**"Haltox"** இது கடைகளில் கிடைக்கும் மலிவான அன்ரிஓட்சிசன் (ரூபா 300/கிலோ). இதனை 250 கிராம்/ தொன் என்னும் வீதத்தில் தவிட்டுடன் கலக்கும் போது கெடுதல் அடையும் வீதம் சராசரியாக கட்டுப்படுத்தப் படுகிறது.

இதற்கு தீர்வாக, அன்ரிஓட்சிசன் உடன் சேர்த்து 60-80$^{0}$C இற்கு தவிட்டினை வெப்பப்டுத்துவதன் மூலம் கொழுப்பு கெடுதல் அடைவது முழுமையாக 6 மாத காலம் வரை கட்டுப்படுத்தப்படும். ஆனால் புழுங்கல் அரிசி தவிட்டில் உள்ள கொழுப்பு 4 மாதத்திற்கு கெடுதல் அடைவதில்லை. எனவே இதனை 4 மாத காலம் வரைக்கும் நேரடியாக பயன்படுத்திக் கொள்ளலாம்.







This is a non-technical summary of the project report titled "Effect of storage and time a nd added antioxidants on rancidity and nutritive value of rice polish" supervised by Prof. K. Samarasinghe*, Department of Animal Science.

* ksamaras12@gmail.com

1st place in Research Brief Competition- Tamil language



# வறுமை ஒழிப்புக்கும் வாழ்வாதார அபிவிருத்திக்கும் அரச-தனியார்-பொது மக்கள் இணைந்தவாரியான கூட்டுப்பங்காண்மையின் பங்களிப்பு

**பாத்திமா ஜுமானா**

பொதுமக்களுக்கு அரச உட்கட்டமைப்பு வசதிகளை வழங்குவதற்காக அரச-தனியார் இணைந்த கூட்டுப்பங்காண்மைத்திட்டங்கள் அறிமுகப்படுத்தப்பட்டன. இருப்பினும், இவ்வாறான, கூட்டுப்பங்காண்மைகள் பொதுமக்களுக்கான சேவை நோக்கை கொண்டிருப்பதனாலும், பொதுமக்களே பிரதான பங்குதாரர்களாக இருபப்தனாலும் காலப்போக்கில் பொதுமக்கள் ஈடுபாட்டுக்கான கேள்வி அதிகரித்தது. இதன் விளைவாகவே அரச-தனியார்-பொதுமக்கள் கூட்டுப்பங்காண்மைகள் அமுல்ப்படுத்தப்படுகின்றன. இவ்வாறான திட்டங்கள் அமுல்ப்படுத்தப்படுவதுற்கான பிரதான நோக்கம் விவசாயிகளின் வறுமை ஒழிப்பும் பேண்தகு வாழ்வாதார விருத்தியுமேயாகும். அண்மையில் பால்ப்பண்ணை கடற்பாசி மற்றும் உயர் பெறுமதி கொண்ட ஏற்றுமதிப் பயிர்களுக்கான கூட்டுப்பங்காண்மைத்திட்டங்கள் அமுல்ப்படுத்தப்படுவதற்கான இலக்குகளை அடைகின்றனவா என்பது ஆய்வு செய்யப்பட வேண்டிய விடயமாகும்.



இலங்கையின் ஏற்றுமதி வர்த்தகத்தில் அண்மைக் காலங்களில் மிகப் பெருமளவிலான அந்நியச் செலாவணியைத் தரும் பயிராக ஊறுகாய்க்குதவும் **வெள்ளரிப்பயிர்** இருந்து வருகின்றது. ஐக்கிய நாடுகள் சபையின் தரவுக் கணிப்பின் படி இப்பயிர் உற்பத்திகளின் வருடாந்த ஏற்றுமதியானது அதிகரிக்கின்றது. இவ்வாறானதொரு ஏற்றுமதி வர்த்தகத்தில் விவசாயியகள் ஈடுபடுத்தப்படுவதனூடாக அவர்கள் வறுமை ஒழிப்புக்கும் வாழ்வாதார விருத்திக்கும் பங்களிப்புச் செய்ய முடியும்.

அண்மையில் வெள்ளரிப்பயிர்ச் செய்கையில் ஈடுபடும் கூட்டுப்பங்காண்மைத் திட்டப் பயனாளிகளைம் பயனாளி அல்லாதவர்களையும் கொண்டு மேற்கொள்ளப்பட்ட ஆய்வின் படி பயனாளிகனின் பயிர்ச் செய்கைக்கான உற்பத்திச் செலவானது பயனாளி அல்லாதவர்களை விட அறுவடை kg க்கு 2 ரூபாய் குறைவாகவே உள்ளது. அதே போல் கூட்டுப்பங்காண்மைத் திட்டங்களுக்கூடாக வெள்ளரிப்பயிர்ச் செய்கையில் ஈடுபடும் பயனாளிகள் பயனாளி அல்லாதவர்களை விட 10,050 ரூபாய் அதிக இலாபம் ஈட்டக்கூடியதாக இருக்கின்றது. இவ்வாய்வின் இன்னொரு முடிவின் படி முயற்சியாண்மைத் திறனுடைய வெள்ளரிப்பயிர்ச் செய்கையாளர்கள் திறன் குறைந்தவர்களை விட 1.5 மடங்கு அதிக வருவாயை ஈட்டக்கூடியவர்களாகவும் மேலதிகமாக ஈடுபடுத்தப்படும் ஒவ்வொரு குடும்பத் தொழிலாளிகளால் 1.2 மடங்கு அதிக வருவாயை இப்பயிர்ச் செய்கையிலுருந்து ஈட்டக்கூடியதாகவும் இருக்கின்றது.




ஆகவே அரச-தனியார்-பொதுமக்கள் இணைந்த வாரியான கூட்டுப்பங்காண்மைத் திட்டங்கள் விவசாயிகளின் வாழ்வாதார விருத்திக்கு வழிவகுக்கின்றன. அத்துடன் வெள்ளரிப்பயிர்ச் செய்கையில் இவ்வாறான திட்டங்களுக்கான பயனாளிகளைத் தெரிவு செய்யும் போது அவர்களின் முயற்சியாண்மைத்திறனும், குடும்பத்தொழிலாளர்கள் ஈடுபடுத்தப்படும் வீதமும் கருத்திற் கொள்ளப்பட வேண்டும்.

This is a non-technical summary of the project report titled "Contract farming for smallholders in commodities with export potential: Assessing the farm profits of Gherkin farmers in Sri Lanka" supervised by Dr. D.V.P. Prasada*, Department of Agricultural Economics and Business Management.

* pahan1@gmail.com

## Judging Panel of Research Brief Competition – FAuRS – 2016



**Shihar Aneez**

He is the acting bureau chief for Reuters News Agency for Sri Lanka and Maldives based in Colombo, mainly covering economic, financial, and political risk topics. He started his career as a freelancer in 1998. Since joining Reuters in 2007, he has specialised in handing data-led reporting on Sri Lanka along with some hostile environment reporting. He is the current president of Sri Lanka-based Foreign Correspondents' Association, leading it for a third term after transforming the dormant organization to a very active forum despite suppression of media and lack of space for media freedom between 2013/14. He is an alumnus of University of Peradeniya, having an honors degree in Bachelor of Science (Agriculture), majoring in economics. He is a Konrad-Adenauer-Stiftung scholar from 2007 to 2009, where he was awarded a media fellowship to complete a Masters in Arts degree in Journalism at the Ateneo de Manila University in the Philippines. He has also completed a diploma in multimedia journalism at the Ateneo de Manila University in the Philippines in 2015 and Masters of Arts in Economics degree at the University of Colombo in 2012.



**Nalin Munasinghe**

At present, he holds the position of National Programme Manager – Sri Lanka UN-REDD Programme. He has over 17 years of working experience in the development sector with an array of stakeholder audiences including UN, Government, Development Partners, Civil Society, Private Sector and Grass root level communities. He is a Bachelor of Science in Agriculture specialized in Extension obtained from the University of Peradeniya and also holds a Master's Degree in Economics obtained from the University of Colombo. Nalin is a qualified marketer with a Postgraduate Diploma in Marketing offered by the Chartered Institute of Marketing (CIM) - UK as well as a Chartered Marketer of the same. In addition, he is also serving as a Senior Lecturer, Trainer and a Consultant in Marketing and Management for over 15 years serving many governments, non-governmental and the private sector organizations.



**Ranga Pallawala**

He is currently working as the Chief Executive Officer of Janathakshan GTE Ltd., an organization working on green and sustainable development issues. He is also an alumnus of Faculty of Agriculture, University of Peradeniya and a well-known personality in international climate change related work. He represented Sri Lankan government delegation in UNFCCC International negotiation in the capacity of Climate Finance Specialist. He is also serving as a member of National Expert Committee on Climate Change Adaptation and UNEP Asia Pacific Expert Panel on Climate Finance Direct Access. Ranga is a professional corporate trainer specialized in Outbound Training (OBT), Business Leadership and soft skills enhancement.



**Dimuthu Ruwan Piyasena**

He is a certified trainer & coach in the corporate sector. He has been certified to conduct 'Personality @ work' based on MBTI (Myers-Briggs Type Indicator) & 'Seven Habits of Highly Effective People' for leadership development. Dimuthu is a certified Associate Coach from the Corporate Coach academy, Malaysia. He counts over 15 years of management experience in three leading multi-national companies (Unilever Sri Lanka, Fonterra Brands & AIA Insurance Lanka PLC). His experience in the corporate sector is in the areas of Brand Management, Human Resources Management and Sales Management. Currently he holds the position of Deputy General Manager, Development & Operations – Agency at AIA Insurance Lanka PLC. Dimuthu was adjudged as the Captain of the Year at the Global Aviva Customer Cup competition held in Gasstad, Switzerland in 2011. He holds a MBA in HRM from PIM whilst his first degree is in Agriculture at University of Peradeniya. Dimuthu is a known figure on TV screen as a result of his part-time hobby of news reading & contributes as a visiting lecture at PIM in HR Development.

# Resource persons who served in capacity building of contestants in Research Brief Competition FAuRS – 2016

**Shihar Aneez:** Correspondent for Sri Lanka and Maldives at Thomson Reuters

**Eranda Bandara:** Freelance Creative Director/Creative Strategist

**Asoka Dias:** Director, MTV Channel (Pvt) Limited /MBC Networks (Pvt) Limited

**Sahan Dissanayake**: Assistant Professor of Economics, Colby College, USA

**Sunil Gamage:** Livestock specialist /Freelance consultant

**Dimuthu Ruwan Piyasena**: Deputy General Manager of Sales, Training and Development at AIA Insurance Lanka PLC

**Haritha Wedathanthrige**: External Collaborator / Independent Consultant International Labor Organization

**Chaminda Wariyagoda:** Deputy News Editor, Rivira Media Corporation

# Designers of "Hanthana Blossom"

**Ms. Chinthani Rathnayake and Ms. Kaushalya Rathnayake**

Applied Economics and Business Management majored undergraduates currently serving in the temporary staff of the Department of Agricultural Economics and Business Management

# Coordinators of "Hanthana Blossom"

**Ms. Uvasara Dissanayake:** Person-in-charge/ Research Video Competition of FAuRS – 2016
Senior Lecturer
Department of Agricultural Extension
Faculty of Agriculture

**Dr. Venura Herath:** Person-in-charge/ Scientific Eye Photography Competition of FAuRS – 2016
Senior Lecturer**,** Head of the department
Department of Agricultural Biology
Faculty of Agriculture

**Dr. Suranga Kodithuwakku:** Person-in-charge/ Research Brief Competition of FAuRS – 2016
Senior Lecturer
Department of Animal Science
Faculty of Agriculture

**Professor Jeevika Weerahewa**: Coordinator/ FAuRS – 2016
Professor
Department of Agricultural Economics and Business Management
Faculty of Agriculture











The financial support provided by National Science Foundation to publish this magazine is acknowledged.

ISSN 9999-9999